# පරිසර සම්පත් පැතිකඩ
# 2025

## 447 C - ගැහැණුවල

**හැඳින්වීම**

I. මූලික තොරතුරු

a) වසම හා අංකය - 447/C ගැහැනුවල
b) වපසරිය ($km^2$ හා අක්කර හා හෙක්ටයාරවලින් ) – 75.022 h
- 0.75km*
c) ප්‍රා ලේ කොට්ඨාසය - හෝමාගම.
d) ගොවිජන හා කෘෂිකර්ම කොට්ඨාසය - හෝමාගම - 1/3/5 / ගැහැණුවල
e) සෞ වෛ නි කොට්ඨාසය - හෝමාගම.
f) පශු වෛ නි කොට්ඨාසය - හෝමාගම.
g) බීට්ටු වන කාර්යාල කොට්ඨාසය - කළුතර
h) අඩවි වන කාර්යාල කොට්ඨාසය - වග
i) වාරිමාර්ග ඉංජිනේරු කොට්ඨාසය - කොළඹ

II. ජනගහණය (විමර්ශන හා උපුටාගැනීම් දැක්විය යුතුය) – මුලු ජනගහනය 2599
-ස්ත්‍රී - 1404
- පුරුෂ - 1195
( *මූලාශ්‍රය : 2024 සම්පත් පැතිකඩ*)

III. ජනාවාසකරණයේ ස්වභාවය - ග්‍රාමීය

IV. දේශගුණික තොරතුරු

a) අක්ෂාංශ හා දේශාංශගත පිහිටීම - අක්ෂාංශ -6.84
දේශාංශ - 80.00
b) උෂ්ණත්වය (සාමාන්‍ය/උපරිම/අවම) – සාමාන්‍ය -30.68C
උපරිම - 32C
අවම - 29.8C
c) වර්ෂාපතනය (mm) – 390mm
d) සාපේක්ෂ ආර්ද්‍රතාව - 33%

V. පාංශු තොරතුරු

a) පසේ ස්වභාවය - වැලි පස
b) පසේ වර්ගය - රතු කහ පොඩ්සොලික්
c) සුලබ පාෂාණ ස්ථිත්වය (ග්‍රැනයිට්/ග්‍රැෆයිට්/ෆෙල්ස්පාර් ආදිය) - ග්‍රැනයිට්

2. පරිසර සම්පත් පැතිකඩක් පිළියෙළ කිරීමේ අවශ්‍යතාව

I. සම්පත් පිළිබඳ සමාලෝචනය කිරීම

II. තිරසර සම්පත් භාවිතාව හා කළමනාකරණය කිරීම

III. පාරිසරික ගැටළු හඳුනාගැනීම හා ඒවාට විසඳුම් යෝජනා කිරීම

IV. පරිසර කළමනාකරණයෙහිලා ප්‍රජාවේ දායකත්වය,සහභාගීත්වය හා අවබෝධය පුළුල් කිරීම

V. සංවර්ධන යෝජනා හඳුනාගැනීම හා පරිසර ශක්‍යතා සමගාමී කිරීම

VI. ආපදා අවදානම් හඳුනාගැනීම හා බලපෑම් අවම කරගැනීම

VII. අඛණ්ඩ මෙහෙයුම්කරණය,අධීක්ෂණය හා අගැයීම ස්ථාපිත කිරීම.

3. ස්වභාවික සම්පත් පැතිකඩ

I. භෞමික සම්පත්

a) වපසරිය/භූමි ප්‍රමාණය (km2 හා අක්කර හා හෙක්ටයාරවලින්) - අක්කර 187 රූඩ්.3 -පර්චස්.9

b) භූමි පරිහරණ සැලසුම

- කෘෂිකාර්මික කටයුතු සඳහා භූමි පරිහරණය
    i. වී - අක්කර 45
    ii. වෙනත් ධාන්‍ය බෝග (ඉරිඟු/මුං/කවුපි ආදිය) - නැත.
    iii. අපනයන කෘෂි බෝග (ඇමුණුම 01) - අක්කර 1
    iv. භූමි යෙදවුම
        - ගොඩ ඉඩම් - අක්කර 129 රූ.2 පර්චස් 32
        - මඩ ඉඩම් (ශ්‍රේණිය සහිතව) - අක්කර 58
        - පුරන් වූ /අත්හැර දැමූ - අක්කර 12 රූ.3

c) පසේ ස්වභාවය හා සාඵල්‍යතාව - වැලි මිශ්‍ර කලු පැහැති සරු පසක්

d) පාංශු ඛාදනයේ ස්වභාවය - වාර්තා වී නොමැත.

e) පාංශු හායනයේ ස්වභාවය - වාර්තා වී නොමැත.

II. ජලජ සම්පත්

a) මතුපිට ජල මූලාශ්‍ර

- ගංගා - නොමැත.
- අතු ගංගා /ඔය/දොළ - නොමැත.
- ඇල මාර්ග - ගොවි ජන සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් පාලනය වන සුලු වාරි මාර්ග කිහිපයක් ඇත.[ මහ ඇළ, රුක්ගහකොට්ටනුව වම් හා දකුණු ඇල, පුවක්ගහ කුඹුර ඇල, හීන් ඇල]
- වැව් /තටාක - නොමැත.
- පොකුණු/ නිර්මිත පොකුණු (අත්හළ ගල්වල) - නොමැත.

- දිය උල්පත් - නොමැත.

*මූලාශ්‍රය : දත්ත ගොනුව කෘ.ප.නි.ස ගැහැනුවල 2025*

b) භූගත ජලය
- ළිං - 262
- නළ ළිං - නොමැත.

c) වර්ෂාපතනය
- වාර්ෂික මධ්‍යන්‍ය වර්ෂාපතනය (mm) – 280mm
- වර්ෂා ක්‍රමය (මෝසම්/සංවහන) - නිරිත දිග මෝසම , සංවහන

d) වාරිමාර්ග කටයුතු
- මහා වාරි ව්‍යාපාර - නොමැත.
- සුළු වාරි ව්‍යාපාර - නොමැත.

e) ජලයේ ගුණාත්මකබව - 6.5 – 7.5 pH

f) ජල සුලබතාව - පවුල් 50% කට පමණ ළිං ජලය භවිතයට ගනී. පවුල් 30 % ක් පමණ ප්‍රජා ජලය භාවිතයට ගනී. 40% ක් පමණ ජල සම්පාදන මණ්ඩලය මගින් ලබා දෙන ජලය භාවිතයට ගනී. වසම තුළ ජල හිගයක් වාර්ත වී නොමැත.

III. වනාන්තර හා වනවගාවන්

a) වන වැස්මේ වපසරිය – සැලකිය යුතු මට්ටමකින් වාර්තා වී නොමැත.

b) සුලබ ශාක පිළිබඳ ලේඛනය

| වර්ගය | පොල් | පුවක් | අඹ | රඹුටන් | කොස් | කෙසෙල් | දෙල් | කිතුල් | වෙරලු |
|---|---|---|---|---|---|---|---|---|---|
| ප්‍රමාණය | 460 | 128 | 62 | 54 | 45 | 820 | 10 | 18 | 18 |

c) දැවමය නොවන වන නිෂ්පාදන (NTFPs)
- ආහාර හා ආකලන - ආහාර - කොස් , දෙල් , පොල් , රඹුටන් , දූරියන් , අලිගැට පේර ආකලන ශාක - ගම්මිරිස් , ගොරකා, දෙහි ,සියඹලා, කරාබුනැටි,රම්පේ, කරපිංචා.
- දේශීය ඖෂධ - කොහොඹ , නික , පාවට්ට , ආඩතොඩ , කොබ්බෑ , කැටකෑල, යකි නාරං , ඉරමුසු ,එඬෙරු , කොමාරිකා, සියඹලා.
- ශාකසාර (රෙසින්/තෙල්/ලාටු/මැලියම් ආදිය) - නොමැත.
- අත්කම් අමුද්‍රව්‍ය (වේවැල්/හණ/පට්ට ආදිය) - නොමැත.
- ඉදිකිරීම් අමුද්‍රව්‍ය - කොස් , පුවක් , පොල් , ගිනිකූරු , කිතුල් , මහෝගනී , තේක්ක.
- සැරසිලි හා සංස්කෘතික වටිනාකම් සහිත ද්‍රව්‍ය - මඩු , පුවක් , හබරල , ක්‍රොටන් , මල් වර්ග , හාතවාරිය.

d) වන විනාශකිරීම් පිළිබඳ විස්තරය - අදාළ නොවේ.

e) වනවගා ව්‍යාපෘති විස්තරය - අදාළ නොවේ.

f) වන සංරක්ෂණ ප්‍රයත්නයන්

- ප්‍රජා වැඩසටහන් -
  i. Clean ශ්‍රී ලංකා වැඩසටහනට සමගාමීව ශ්‍රමදාන පැවැත්වීම.
  ii. කන්දවත්ත මාර්ගය දෙපස පිරිසිදු කිරීමේ වැඩසටහන
  iii. ග්‍රාම සංවර්ධන සමිතිය.
  iv. ආටිගල මාර්ගය දෙපස පැල සිටුවීමේ වැඩසටහන.
- රාජ්‍ය/රාජ්‍ය නොවන/ ස්වේච්ඡා සංවිධාන මඟින් - අදාළ නැත.

IV. ජෛව විවිධත්වය

a) ශාක ලේඛනය - කොස්,පොල්,කුඹුක් , තේක්ක , රුක්කත්තන ආදි වෘක්ෂයන් දක්නට ලැබේ.

.

b) ශාක වර්ගීකරණය (දේශීය/ඒකදේශීය/හඳුන්වාදුන් විදේශීය හෝ දේශීය/ස්වභාවිකෘත විදේශීය හෝ දේශීය/ආගන්තුක/ආගන්තුක-ආක්‍රමණශීලි වශයෙන්) (ප්‍රස්තාර සහිතව)


| දේශීය ශාක | ඒක දේශීය ශාක | හඳුන්වාදුන් විදේශීය හෝ දේශීය | ස්වභාවිකෘත විදේශීය හෝ දේශීය | ආගන්තුක | ආගන්තුක-ආක්‍රමණශීලි වශයෙන් |
|---|---|---|---|---|---|
| කොහොඹ<br>බුරුත<br>කදුරු<br>වෙරලු<br>මුරුංගා<br>ගොරකා<br>පොල්<br>කෙසෙල්<br>ඇඹරැල්ල<br>බෙලි | ගොඩපර<br>හල් | ඇකේශියා | කොස් | නැත | නැත |

c) අන්තරායට ලක්වූ කාණ්ඩ (CR/EN/VU-IUCN)

4. පරිසරය හා සම්බන්ධ මානව ක්‍රියාකාරකම්

I. කෘෂිකර්මය

a) ප්‍රධාන භෝග (වී)



යල කන්නේ හා මහ කන්නේ වී වගාවේ අස්වැන්න.

- යල කන්නේ වගා කරන ගොවීන් ගණන - 30.
- අක්කරයකට බුසල් යල කන්නේය සඳහා - 38ක් පමණ.
- යල කන්නේ වගා කරන ප්‍රමාණය - අක්කර 22.
- යල කන්නයේ සාමාන්‍ය අස්වැන්න - බුසල් 836
- මහ කන්නයේ වගා කරන ගොවීන් ගණන - 43
- මහා කන්නේ අක්කරයට - බුසල් 45ක් පමණ
- මහ කන්නයේ වගා කරන ප්‍රමාණය - අක්කර 38
- මහ කන්නේ සාමාන්‍ය අස්වැන්න - බුසල් 1710

වසම තුළ වගා කරන වී වර්ග.

- LD 386 ( රතු සම්බා)
- BW 367 (සුදු සම්බා)
- BG 352 (සුදු නාඩු)
- දේශීය වී -සුවඳැල් / මඩ තවාළ

(මූලාශ්‍රය : දත්ත ගොනුව කෘ.ප.නි.ස ගැහැණුවල 2025)


b) අතිරේක භෝග (ධාන්‍ය හා ආහාර බෝග වර්ග) - නොමැත.

c) අපනයන භෝග (තේ/පොල්/රබර්) - තේ , රබර් වසම තුළ වගා කර නොමැත. *අක්කර 01ක පමණ ගෙවතු තුල එදිනෙද පරිභෝජනයට පොල් වගා කර ඇත.*

d) සුළු අපනයන භෝග /අපනයන කෘෂි බෝග (ඇමුණුම 01) - *ගම්මිරිස් වගාව සුලු වශයෙන් දක්නට ලැබේ.*


e) වෙනත් වානිජ භෝග (පාම්/අගාවුඩ් ආදිය) - නොමැත

f) රසායනික පොහොර යෙදවුම (ප්‍රස්තාර සහිතව)




*දත්ත ගොනුව කෘ.ප.නි. ගැහැණු වල 2025*

g) කෘමි/පළිබෝධනාශක යෙදවුම (ප්‍රස්තාර සහිතව)




h) සම්ප්‍රදායික කෘෂිකාර්මික පිළිවෙත් - සාම්ප්‍රදායික පිළිවෙත්වලට අනුව මෙම ප්‍රදේශයේ කන්න අවසානයේ ප්‍රදේශවාසීන්ට හා කෙත් යායට අශිර්වාද කරමින් කිරි අම්මාවරු සඳහා දානයක් දීම සිදු කෙරේ.

i) නවීන කෘෂිකාර්මික පිළිවෙත් - 2024 වර්ෂයේදී ගොවීන් සඳහා පැරෂට් ක්‍රමයට වී වගා කිරීම හඳුන්වා දෙන ලදි.

j) යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) - අදාළ නොවේ.

කෘෂිකර්මාන්තය කෙරෙහි වන අභියෝග හා දුෂ්කරතා (ස්වභාවික ආපදා/කෘමි හා පළිබෝධ බලපෑම්) –

1.කාලගුණයේ බලපෑම් - අධික වර්ෂපතනය හා අනපේක්ෂිත වියළි කලගුණය හේතුවෙන් වගාවට වෙන හානි.

2. අස්වැන්න අඩු වීම.

3.ලාභ ලැබීමට නොහැකි විභවයක් මතුවීම. (වියළි කලාපයට සපේක්ෂව තෙත් කලාපයේ අස්වැන්න අඩු වීම)

4.පූර්ණ කාලීන ගොවියන් නොමැති වීම .

5.ශ්‍රම හිගය,පොහොර, පළිබෝධ නාශක හා යන්ත්‍ර සූත්‍රවලට ඉහල මිලක් දැරීමට සිදු වීම.

II. පශු සම්පත් කර්මාන්ත

a) සුලබ පශු කර්මාන්ත යෙදවුම් (ගව/මීගව/එළු/කුකුළු/වෙනත්)

b) පශු කර්මාන්තය සඳහා යෙදෙන ආහාර පිළිබඳ විස්තරය (ස්වාභාවික/කෘත්‍රිම/මිශ්‍ර)

| අයිතිකරුගේ නම | ගව | කුකුළන් | එළු | ආහාර | අරමුණු |
|---|---|---|---|---|---|
| මුදිත ප්‍රසාද් මයා . | එළගවයන් - 15<br>මී ගවයන් -20 | - | - | මිශ්‍ර | කිරි ලබා ගැනීම සඳහා. |
| ඉලංගරත්න මයා. | මී ගවයන් -2 | - | - | මිශ්‍ර | කිරි ලබා ගැනීම සඳහා. |
| චන්දිකා සෙනෙහෙලතා | - | 12 | - | මිශ්‍ර | බිත්තර ලබා |

| | | | | | |
|---|---|---|---|---|---|
| මිය. | | | | | ගැනීමට. |
| අමිල ප්‍රභාත් මයා. | - | 10 | - | මිශ්‍ර | බිත්තර ලබා ගැනීමට. |
| මානෙල් කුමාරි මිය. | - | 8 | - | මිශ්‍ර | බිත්තර ලබා ගැනීමට. |

c) පශු වෛද්‍යමය සාධක (රෝග ආදිය) – 2022,2023 වර්ෂ වල කුර රෝගය නමැති වසංගත රොගය සැදුනු බවට වාර්ත වී ඇත. එය පාලනය කිරීම සදහා පශු වෛද්‍ය කාර්යාලයේ එන්නත් ලබා දීම සිදු කර ඇත.

III. ධීවර කර්මාන්තය

a) ප්‍රධාන ධීවර අයිතම (මත්ස්‍ය වර්ග) - අදළ නොවේ.
b) ධිවර කාර්මික පරිචාර (සම්ප්‍රදායික බිලිබෑම/දැල් දැමීම/නවීන ක්‍රම ආදිය) - අදළ නොවේ.
c) ධීවර කර්මාන්තය කෙරෙහි වන අභියෝග හා දුෂ්කරතා- අදළ නොවේ.

IV. ශක්ති ප්‍රභව

a) ප්‍රධාන ශක්ති ප්‍රභව වර්ගීකරණය

- පුනර්ජනනීය ශක්ති ප්‍රභව - ස්වභාවිකව මානව කාල පරාසය තුල නැවත සම්පාදනය කර හැකි ශක්ති ප්‍රභව , ජෛව ඉන්දන , ජල විභවය , සූර්ය ශක්තිය , සුළං බලය පුනර්ජීවන ශක්ති ප්‍රභව වේ.සූර්ය කිරණ භාවිතා කරමින් ලබා ගන්නා ශක්ති ප්‍රභවයක් වන සූර්ය පැනල 7 පමණ වසම තුළ දක්නට ලැබේ.
- පුනර්ජනනීය නොවන ශක්ති ප්‍රභව - භවිතයට ගත් පසු නැවත හට නොගන්නා ඛනිජ තෙල් , සභවික වයු පුනර්ජනනීය නොවන ශක්ති වේ.ඩීසල් , පෙට්‍රල් , ගෑස් වැනි ශක්ති ප්‍රභවයන් වැඩි වශයෙන් ප්‍රදෙශ වාසීන් භවිතා කරයි.

b) ස්වභාවික ශක්ති සම්පත් කොරහි වන ඉල්ලුම හා සැපයුම් අනුපාත විශ්ලේෂණය (ප්‍රස්තාර සහිතව

c)පුනර්ජනනීය ශක්ති ප්‍රභව යෙදවුම් සඳහා ප්‍රජාවේ දායකත්වය -

1. සමාජයේ පුද්ගලයින් කණ්ඩායම් හා ආයතන එක්ව මෙම බලශක්ති මූලාශ්‍ර ප්‍රවර්දනය කිරීම සඳහා එක්ව කටයුතු කර යුතුය.

2.මේ වන විට සුලු පිරිසක් භවිත කරන සූර්ය පැනල පිළිබද ප්‍රජව දැනුවත් කර ප්‍රමාණය වැඩි කිරීමට කටයුතු කර ඇත.

3. සූර්ය පැනල පිළිබදව ප්‍රජව තුළ ඇති අවබෝදය අඩු වීම මෙම ශක්තිය ප්‍රවර්දනය නොවීමට හේතුවකි.

4.සූර්ය පැනල සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදු වීම මේ සඳහා ප්‍රජව යොමු නොවීමට හෙතුවකි .

5.මේ පිළිබදව දේශන මාද්‍ය මගින් දැනුවත් කිරීම .

6.රාජය හා රජ්‍ය නොවන බැංකු හා එක්ව මුල්‍ය සහනදාර හා ණය ක්‍රම හදුන්වා දීම.

7.අමතර ආදායම් ක්‍රමයක් ලෙස සූර්ය පැනල ක්‍රමය හදුන්වා දීම .

8.නව රැකිය ක්‍රමය උත්පාදනය කිරීම.

9.පරිසර දූෂණ අවම කිරීම.

5. සමාජ-සංස්කෘතික සන්දර්භය.

I. පරිසර ගැටළු පිළිබඳ ප්‍රජාවේ අවබෝධය හා විසඳුම් යෝජනාකරණ යන්ත්‍රණය

ගැටළු

- ඉඩම් කැබලි කර විකිණීම නිසා ජනගහනය ඉහළයාම හේතුවෙන් කැලිකසල බැහැර කිරීමේ විශාල අභියෝගයක් වී ඇත.
- ගෘහස්ථවලින් පිට කරන කසල වෙන්න නොකිරීම සුදුසු ලෙස බැහැර නොකිරීමේ ගැටලුව.
- අවට පරිසරයට හා මාර්ග දෙපසට අවිධිමත් ලෙස කසල බැහැර කිරීම නිසා පරිසර දූෂණය හා මැසි මදුරුවන්ගේ ග්‍රහනය ඉහළ යෑම .
- කසල කළමනාකරණය සඳහා විධිමත් යාන්ත්‍රණයක් නොමැතිකම.
- පොල් වගාවන් හා අනෙකුත් බෝග වගාවන් සඳහා ඇති බිම් ප්‍රමාණයේ ඉඩම් කට්ටි වීමත් සමඟ සීමා වීම.
- ජල බැස යාමට කානාණු පද්ධතියක්තියක් නොමැති වීම නිසා මාර්ග දැඩි ලෙස පාංශු ඛාදනයට ලක් වීම.

විසඳුම

- අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා විධිමත් ක්‍රමයක් හඳුන්වා දීම. (ප්‍රාදේශීය සභාව මගින් ප්‍රදේශයේ කුණු එකතු කිරීම සඳහා පැමිණෙන ට්‍රැක්ටරය සතියකට දින දෙකක් හෝ තුනක් ප්‍රදේශයම ආවරණය ලෙස ම කුණු එකතු කිරීමට සකස් කර දී)
- අවිධිමත් ලෙස මාර්ගය දෙපස  කසල බැහැර කිරීම වැළැක්වීම සඳහා රජය මැදිහත්වී නීති සකස්කර ප්‍රකාශයට පත් කිරීම.
- මාස තුනකට වතාවක් හෝ කසල පොලක් පැවැත්වීම.
- මාර්ගය සකස් කිරීම හා ප්‍රදේශයේ කානු පද්ධතිය සකස් කිරීම.
- සීමා සහිත බිම් කැබලි වෙන්දේසි කිරීමේදී පසරිසරයට වන හානිය   වැළැක්වීමට නීති හඳුන්වාදීම.

II. සම්ප්‍රදායික පරිසර දැණුම හා පරිචාර

a) ජනප්‍රවාද  හා ජනශෘතිය - දොන් ආතර් දියෙස් ජයසූරිය මහතා විසින් ගල්වල වැවෙන දුර්ලභ දිය සෙවල වර්ගයක් සොයා ගිය ගමනේදී දැනට ගැහැනුවල පුරාණ විහරය පිහිටි ගල් පර්වතය හමු වී ඇත.ප්‍රදේශයට ගැහැනුවල යන නම ලැබීමට හේතු වී ඇත්තේ මෙම පර්වතයේ පිපිරුමක් එසේ නැත්නම් ගැහීමක් හේතුවෙන් නම් වුනු “ ගැහුනු ගල” පාසු කාලයේදී ගැහැනුගල වශයෙන් නැවත ජන වහරේදී ගැහැනුවල වශයෙනුත් ප්‍රචලිත වී ඇත.

b) දේශීය වෛද්‍ය ක්‍රම

III. සම්ප්‍රදායික ජන කණ්ඩායම් හා පරිසර අභිචරණය - අදාල නොවේ.

IV. පරිසර ගැටළු සඳහා යෙදුණු විසඳුම්/විකල්ප-

- සරල ජීවන තත්වයක් සඳහා හුරු වීම.
- කාබනික පොහොර පමණක් භාවිතා කිරීම.
- කසල කළමනාකරණයට හුරු වීම.

6. කාලීන පාරිසරක අර්බුද හා අභියෝග

I. වන විනාශය /කැළෑ එළිකිරීම - අදාල නොවේ.

II. ජල හිඟය - දැඩි නියං තත්වයකදී හැර ජලය සිදී යාමක් සිදු වී නොමැත.ළිං ජල භාවිතා කරන පවුල් 262ද ජල සම්පාදන මණ්ඩල මගින් ජලය ලබා ගන්නා පවුල් 355ද ප්‍රජා ජල ව්‍යාතිය මගින් ජලය ලබා ගන්නා පවුල් 181ක් සිටී. එබැවින් මෙම ප්‍රදේශය තුළ ජල හිගයක් දැකිය නොහැක.

III. පාංශු හායනය - පාංශු හායනයක් පිළිබඳ වාර්තා වී නොමැත.

IV. කැලි-කසල බැහැරකිරීම - ඉතා සීමිත බිම් ප්‍රමාණයක වැඩි ජන ගහනයක් ජීවත් වීම නිසා ගස්ත වලින් පරිසරයට බැහැර කරන කැලි කසල ප්‍රමාණය මෙම ප්‍රදේශයට විශල අභියෝගයක් වී ඇත.කැලි කසල බැහැර කිරීමට සුදුසු ඉස්තන නොමැති වීම නිසා සමහර පුද්ගලයන් එම කුණු කසල මාර්ගය අසලට ගෙනත් දැමීමෙන් පරිසරයට විශාල හානියක් සිදු වෙමින් පවතී.ආටිගල මාර්ගයේ නඩුහේන හංදියට යන මාර්ගය දෙපසට කැලි කසල ගෙනත් දැමීම නිසා එම මාර්ගයේ දැඩි දුර්ගන්දයක් සහ සතුන් කුණු කසල ඇද දැමීම නිසා මාර්ගය දෙපස අපවිත්‍ර වී ඇති ආකාරය දක්නට ලැබේ. කුණු රැගෙන යාම නිසා ප්‍රදේශීය සභාවේ ට්‍රැක්ටරයක් සතියට එක දිනක් පැමිණෙන නමුත් එම ට්‍රැක්ටරය වසමේ සමහර ස්තාන වලට නොයෑම නිසා ප්‍රදේශවාසින් දැඩි අර්බුදයකට ලක් වී ඇත.
කසල මාර්ගය අසලට ගෙනත් දැමීමෙන් පරිසරයට විශාල හානියක් සිදු වෙමින් පවතී.ආටිගල මාර්ගයේ නඩුහේන හංදියට යන මාර්ගය දෙපසට කැලි කසල ගෙනත් දැමීම නිසා එම මාර්ගයේ දැඩි දුර්ගන්දයක් සහ සතුන් කුණු කසල ඇද දැමීම සුලබව නිරීක්ෂණය වේ.

දේශගුණික විපර්යාසවල බලපෑම - වර්ෂපතනයේ ලැබී ඇති වී ඇති වෙනස්කම් හා උෂ්ණත්වයේ ඇති වෙනස්කම් හැර දේශගුණික වශයෙන් විශාල බලපෑමක් වාර්තා වී නොමැත.

V. ආගන්තුක හා ආගන්තුක-ආක්‍රමණශීලි විශේෂවල බලපෑම - වාර්තා වී නොමැත.

7. පාරිසරික තිරසර සංවර්ධන අභිමතාර්ථ සපථ කරගැනීම (ඇමුණුම 02)

1. අභිමතාර්ථ අංක 06 - පිරිසිදු පානීය ජලය හා සනීපාරක්ෂා

සියලු දෙනාට ආරක්ෂිතව හා ළඟා විය හැකි පානීය ජලය සඳහා සාධාරණ ප්‍රවේශයක් ලබා ගැනීම මෙම අභිමාර්තයේ වේ. ජල හිඟයකින් තොරව මෙම ප්‍රදේශයේ පවත්නා භූගත පිරිසුදු ජලය ආරක්ෂා කිරීම හා කළමනාකරණය කිරීම අරමුණ ඉතා සීග්‍රයෙන් නාගරීකරණයක වූ මෙම ප්‍රදේශය තුළ ඉඩම් කැබිලි වීමත් සමඟ සීමිත බිම් ප්‍රමාණයක නිවාස ඉදිකිරීමත් හේතුවෙන් ගෘහස්ථ වලින් පිටවන අපද්‍රව්‍ය ප්‍රමාණය වැඩිවීමත් මෙම ප්‍රදේශයට විශාල තර්ජනයක් වී ඇත. විශේෂයෙන් සනීපාරක්ෂණය සඳහා සකස් කර ඇති වැසි වැසිකිලි වලවල් හා ගෘහස්ථව පිරිසිදු කිරීම් බැහැර කිරීම සඳහා සකස්කර ඇති අපද්‍රව්‍ය වලවල් වැඩිවීම භූගත ජලයේ වෙනස් වීමට සඳහා බලපානු කෘෂිකර්මාන්තය මඟින් ජලය වෙත මුදා හරින රසායනික ද්‍රව්‍යවල ප්‍රමාණය වැඩිවීමත් ජල දූෂණයට මෙම ප්‍රදේශය තුළ බලපා ඇත.

2. අභිමතාර්ථ අංක 07 - ධරණීය හා සුනිත්‍ය බලශක්තිය

සම්පත් සඳහා බලශක්ති කාර්යක්ෂමතාව තිරසර යටිතල පහසුකම් සහ මූලික සේවා වෙත ප්‍රවේශය සැපයීම හරිත හා සුනීත රැකියා අවශ්‍යතා සුලභ කරමින් සැවොම සඳහා වන ගුණාත්මක ජීවිතයක් ළඟා කිරීම මෙමගින් අපේක්ෂා කෙරේ.

ධරණීය ශක්තිය.

පුනර්ජනනීය නොවන ශක්ති ප්‍රභව යටතේ අප ප්‍රදේශයේ වල දැකිය හැක්කේ සූර්ය පැනලයි .මේ සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදුවීම ප්‍රජාව තුළ පවත්නා අවබෝධය නොමැතිකම තාක්ෂණික ගැටලු හේතුවෙන් වැඩි පිරිසක් යොමු වී නොමැති බව දැකිය හැක..

රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන එක්ව සූර්ය පැනල වල ඇති වාසි හඳුන්වාදී ඒ පිළිබඳ ප්‍රජාවට අවබෝධයක් ලබා දී දැනට වසම තුළ පවත්නා සූර්ය පැනල හතක ප්‍රමාණය නැංවීමට

කටයුතු කිරීම ඉතා වැදගත් වෙයි.

සුනීත බලශක්තිය උපරිම පරිදි කාර්යක්ෂම භාවිතා කිරීමට හැකියාව ඇත. අඩු ශක්තියක් භාවිතයෙන් වැඩි ප්‍රතිඵලයක් ලබා ගත හැකි මෙම බලශක්තිය වසමේ පවුල් වැඩි සංඛ්‍යාවක් පරිභෝජනය කරන බව දැකිය හැක.

LED බල්බ,Sola Street Lamps,

Energy efficient electrical appliances

smart grids ,Insiulated bail dings.

මෙම සක්ශීන් සඳහා වියදම අඩුවේ..

පිරිවැය හා ශක්තිය අපව්‍යයනය අඩුය.

පරිසර හිතකාමී ක්‍රමවේ.
ධරණීය ශක්තිය දිගු කාලයක් පවත්වා ගත හැකිය.
සුනිත්‍ය ශක්තිය කාර්යක්ෂමව වියදම් අඩුවෙන් භාවිතා කරන බලශක්තියකි
මෙවැනි බලශක්ති පද්ධති දෙකක් එකට යොදාගතහොත් තිරසර
සංවර්ධනයකකට ළඟා වීමට හැකියාව ඇත.

## 3. අභිමතාර්ථ අංක 12 - තිරසර පරිභෝජන හා නිෂ්පාදන රටාවන්

පරිසර ආරක්ෂා කර ගනිමින් ගැනීම සඳහා ස්වභාවික සම්පත් සිරසර කළමනාකරණය කරමින් ආර්ථික සංවර්ධනය හා සමාජ සුභසාධනය දියුණු කිරීම තිරසාර පරිභෝජනය හා නිෂ්පාදනයේ අරමුණයි .ජීය අවශ්‍යතාවන් හඳුනා ගැනීම ඒවා සපුරාලමින් තිරසර හිතකාමී බව තහවුරු කරමින් කාලීන ආර්ථිකයක් ළඟා කර ගැනීමේ තිරසර සංවර්ධනයේ මූලික අරමුණු වන අතර ඒ සඳහා තිරසර නිෂ්පාදන හා වර්ධනය කිරීම අත්‍යවශ්‍ය වේ . අහිතකර පරිසරයේ පරිසර පාරිසරිකය සමාජ බලපෑම් සීමා කරමින් නිෂ්පාදනයන් කෙරෙහි භාණ්ඩ හා සේවාවන් වෙළඳපොළ සැකසීම තිරසර පරිභෝජනයේ ඉතා වැදගත් වේ. මූලික අවශ්‍යතා වන ආහාර නිවාස සෞඛ්‍ය ගමනාගමනය සහ අධ්‍යාපනය යන සේවාවන් දැන්වීම් තුළින් ජීවන තත්වයේ ගුණාත්මක භාවය ඉහළ නැංවීම හා පරිසර හිතකාමී ආර්ථික සංවර්ධනයක් තුලින් දියුණු කිරීම.
විමෝචනය හා සම්පත් නස්තිය අවම කරමින් අඩු සම්පත් ප්‍රමාණයක් භාවිතා කරමින් සමෘද්ධියක් ලබාගත හැකි තිරසාර පරිභෝජන හා නිෂ්පාදන මින් කරනු ලැබේ .
මෙහි ප්‍රධාන අරමුණ
1. සම්පත් කාර්යක්ෂම භාවිතය
ජලය විදුලිය අඩු වියදමින් උපරිම ප්‍රතිලාභ.
2 ප්‍රතිචක්‍රීකරණය සහ නැවත භාවිතය
ප්ලාස්ටික්, ලෝහ ,කාඩ්බෝඩ්
3. හිතකාමී නිෂ්පාදන ක්‍රම.
නිෂ්පාදනයේදී වායු දූෂණ ජල දූෂණ පරිසර දූෂණය අවම කිරීම.
4. පාරිභෝගික සදාචාරය.
, පරිසරයට හිතකාමී භාණ්ඩ තෝරාගැනීම
organic fair trade.

4. අභිමතාර්ථ අංක 13 - දේශගුණික විපර්යාස හා ඒවායේ බලපෑම්

ඍජු හෝ වක්‍රව සිදුවන මානව ක්‍රියාකාරකම් මගින් වායුගෝලයේ සංයුතියේ ඇති කරන වෙනස් වීම් හේතුවෙන් දේශගුණික විපර්යාසය ඇතිකරයි. වර්තමාන ලෝකයේ වඩාත් අවධානයට ලක් වූ ප්‍රධාන පරිසරය ගැටලුවක් ලෙස දේශගුණික විපර්යාස හැඳින්විය හැක. වායු ගෝලයේ දිගු කාලීනව පවත්වා වෙනස්වීම් ලෙස දේශගුණික වෙනස් වීම් හැඳින්වේ. මාසයක සිට වසර තිහක කාලයක සිදුවන විපර්යාසයක් දේශගුණික විපර්යාසයක් ලෙස හඳුන්වයි . මෙසේ සිදුවන ේශගුණික විපර්යාස සඳහා ජාතික ප්‍රතිපත්ති හා උපායමාර්ග සැලසුම් සැකසීම දේශගුණික වෙනස් වීම් සඳහා බලපාන සාධක ඇතුළත් කිරීම හා අවශ්‍ය සම්පත් වෙන්කිරීම දේශගුණික විපත් සඳහා ජනතාව සූදානම් කිරීම මෙම අභිමතාර්ථයේ අරමුණයි

මෙම ප්‍රදේශයට බලපා ඇති දේශගුණික බලපෑම් වායු උෂ්ණත්වය ඉහළ යාම.
වියළි කාලය වැඩිවීම
කෘෂිකාර්මික බලපෑම්.
ජෛව විවිධත්වයේ බලපෑම්.
ශාක හා සත්ත්ව වර්ග විනාශ වීම්
ආහාර දාමය වෙනස් වීම්.
වසංගත රෝග  ව්‍යාප්තවීම ඩෙංගු මැලේරියා
පිරිසුදු ජලය හා ආහාර ලබා ගැනීමේ අර්බුදය

5. අභිමතාර්ථ අංක 14 - සාගර සම්පත් සංරක්ෂණය හා පිරිමැසුම්දායක භාවිතාව - අදාළ නොවේ.

6. අභිමතාර්ථ අංක 15 - භෞම පරිසර පද්ධතීන් සංරක්ෂණය හා තිරසර භාවිතාව

ගොඩබිම් පරිසර පද්ධතිය තිරසර ලෙස භාවිතා කිරීම වනාන්තර තිරසාර ලෙස කළමනාකරණය කිරීම හා කාන්තාරකරණය වැළැක්වීම ඉඩම් අවභාවිතය වැළැක්වීම හා පිළිසකර කිරීම ජෛව විවිධත්වයට හානි වීම නතර කිරීම මෙම අභිමාර්ථයයි. ජලය ආහාර ආරක්ෂා කිරීම

මෙම ප්‍රදේශයේ පවතින පොදු ස්ථානවල මෙන්ම ගෙවත් තුළ හෝ රුක් රෝපණය සිදු කිරීමට ප්‍රජාව උනන්දුවක් ඇතිකිරීම.
 ශාක වල සතුන්ගේ වාසස්ථාන සුරකීම
පරිසරය සුරකීම සඳහා ප්‍රජාව පෙළඹවීමේ වැඩසටහන්  හා දැනුවත් කිරීම් සිදුකිරීම. ජලය ආහාර ආරක්ෂා කිරීම
මෙම ප්‍රදේශයේ පවතින පොදු ස්ථානවල මෙන්ම ගෙවත් තුළ හෝ රුක් රෝපණය සිදු කිරීමට ප්‍රජාව උනන්දුවක් ඇතිකිරීම. වාසස්ථාන සුරකීම සිදුකිරීම.

ශාක වල සතුන්ගේ වාසස්ථාන සුරැකීම .පරිසරය සුරැකීම සඳහා ප්‍රජාව පෙළඹවීමේ වැඩසටහන් හා දැනුවත් කිරීම් සිදුකිරීම.

## 7. තිරසර පරිසර සංවර්ධනය හා පරිසර කළමනාකරණ යන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සඳහා නව අදහස්,යෝජනා හා නිර්දේශ -

*නව ආකල්ප හා එක් වෙමින් පරිසර කළමනාකරණය සංවර්දනය කිරීම පිළිබඳව මෙයින් සාකච්චා කෙරේ.
* ප්‍රතිචක්‍රිකරනය පරිසරයට එක් කරවමින් හරිත ආර්තිකයක් වෙත යොමු කිරීම . එනම් සංචාරක කර්මාන්තය , හරිත රැකියා , පරිසර ආයතන වැනි දෑ බිහි කිරීමට කටයුතු කිරීම.
*නැවත භාවිතය , නැවත නිශ්පාදනය , නැවත පරිහරනය මත පදනම්ව සම්පත් පරිහරනය කිරීම තුළින් circular economic තත්වයක් ඇති කිරීම.
*පරිසර හිතකාමී විකල්ප නිශ්පාදන ප්‍රවර්දනය කිරීම , හරිත රැකියා හා තිරසර පරිසර ගම්මාන වැනි ජාතික වැඩසටහන් සඳහා යොමු වීම .
*කර්මාන්ත හරිතකරණය කිරීමේ වැඩසටහන් ක්‍රියත්මක කිරීම හරිත ව්‍යාපාරය සහ සමාජ ව්‍යවසායකයින් සිට අවදානමට ලක් විය හැකි ප්‍රජාව සවිබල ගැන්වීම .
*නව නිශ්පාදන හඳුන්වා දීමේදී පරිසරයට අවදානම ආඩු ස්වාභාවික නිශ්පාදන සඳහා ප්‍රමුකත්වය ලබා දීම .
*වැහි වතුර ගබඩා කිරීමෙන් සූර්ය පැනල භාවිතය තුළින් ජල ප්‍රවාහනය රටා යොදා ගනිමින් නගර සැලසුම් කිරීම.
*ගොවීන් රසායනික පොහොර වෙනුවට කාබනික පොහොර සඳහා යොමු කිරීම තුළින් පාංශු හායනය වළක්වා ගැනීම .
*රාජය හා පෞද්ගලික අංශ එකතුවක් තුළින් පරිසර තිරසර ව්‍යාපෘති සකස් කර වසම් මට්ටමෙන් ක්‍රියාත්මක කිරීම.
*වසම් මට්ටමින් ප්‍රජා සමිති නිලදාරීන් හා ප්‍රජාව එක්ව මාසිකව පරිසර වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා පරිසර ප්‍රජා සමිතියක් ස්තපිත කිරීම.
*පාසල් දරුවන් ඉලක්ක කර විශය නිර්දේශයට හා ප්‍රයෝගික වැඩසටහන් තුළින් පරිසර සුරක්ශිතභාවය පිළිබඳව අවදානය ලබා දීම.

# 8. ඇමුණුම

සිතියම්- ගැහැණුවල වසමේ සිතියම








a. රූප සටහන් /කටු සටහන්/චිත්‍ර

- පුනර්ජනනීය ශක්ති ප්‍රභව
- පුනර්ජනනීය නො වන ශක්ති ප්‍රභව




19.1 රූපය - පුනර්ජනනීය ශක්ති ප්‍රභව

19.2 රූපය - පුනර්ජනනීය නොවන ශක්ති ප්‍රභව







ගැහැණුවල වසම කන්දේවත්ත වෙන්දේසියේ දැන්වීම . 1962 හා වසමේ විකාශනය ගැන තොරතුරු සැපයූ වයස 92 වන D.G.H. අබේරත්න(පොඩි මහත්තයා)






සම්ප්‍රදායික කෘෂිකාර්මික පිළිවෙත් - කිරි අම්මාවරුන්ගේ දානය හා දේව දානය 2023,2024





නවීන කෘෂිකාර්මික පිළිවෙත් - පැරෂට් වී වගා ක්‍රමය හඳුන්වා දීම .(2024)






ගැහැනුවල ගැහුනු ගල හා ස්භාවික පරිසරය .

කැලි කසල බැහැර කිරීම - ආටිගල මාර්ගය දෙපස කැලි කසල අවිදිමත්ව බැහැර කර ඇති ආකරය හා විදිමත්ව ප්‍රාදේශීය සභාව මගින් කැලි කසල එකතු කිරීම.

වසම තුළ ක්‍රියාත්මක වූ Cleaning Sri Lanka වැඩ සටහන හා ශ්‍රමදාන වැඩසටහන් , රුක් රෝපණ වැඩ සටහන්

වසම තුළ ක්‍රියත්මක ප්‍රජා ජල ව්‍යාපෘතිය .

වසර සියයකට වඩා පැරණී රුක්ගහකොට්ටනුවේ ඇති ප්‍රදේශ වාසීන් වැදුම් පිදුම් කරන පෞරාණීක රුක් ගහ.